**කාත්තාන්කුඩි නගර සභාව - 2021**

**-------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**-----------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**------------------------------**

කාත්තාන්කුඩි නගර සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට කාත්තාන්කුඩි නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**--------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**-------------------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

**------------------------------------------------------------------------------------------**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන

තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂ අවසානයේ පළාත් සභාවෙන් ලැබිය යුතු වැටුප් සහ සහික දීමනා ප්‍රතිපූර්ණය රු.5,612,569ක් මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු ලෙස අනාවරණය කර නොතිබුණි. | ඊළඟ මූල්‍ය වර්ෂයේ මෙය නිවැරදි කර ලැබිය යුතු ප්‍රතිපූර්ණය කිරීම් ලෙස අනාවරණය කරනු ලැබේ. | ලැබිය යුතු දෑ ගිණුම්වල වත්කම් ලෙස අනාවරණය කළ යුතුය. |
| (ආ) | සභාවට අයත් මහජන පුස්තකාලවලට සමාලෝචිත වර්ෂය අවසාන දින වන විට පරිත්‍යාග වශයෙන් රු.1,973,692ක් වටිනා පොත් ලැබී තිබූ නමුත්, ඒවා මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදි ඇතුළත් කිරීමට පියවර ගනු ලැබේ. | වත්කම් ගිණුම්වල හෙළිදරව් කළ යුතුය. |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශ වල ඇතුළත් රු 95,660,790 ක් වටිනා වත්කම් ගිණුම් ශේෂ 05කට අදාල හිමිකම් ඔප්පු, ස්ථාවර වත්කම් ලේඛනය සහ දේපළවල තනි තනි වටිනාකම් තහවුරු කිරීමේ ලිපි ලේඛන, වත්කම් ලේඛන සහ අයිතිය සනාථ කිරීමේ ලිපි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ලියකියවිලි ලබාගැනීමටත්, එයට අදාල ලේඛන විධිමත්ව පවත්වා ගැනිමටත් වර්තමානයේ පියවර ගනු ලැබේ. | වත්කම් සඳහා ලිඛිත සාක්ෂි ලබාගැනීමට කටයුතු කළ යුතුවේ. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| (අ) මුදල් රෙගුලාසි 371 | පසුගිය වර්ෂ 08ක සිට විවිධ අවශ්‍යතා සඳහා ලබාදුන් අත්තිකාරම් රු. 3,694,066 නිරවුල් කිරිමට පියවර ගෙන නොතිබුණි. | දීර්ඝ කාලයක සිට නිරවුල් නොකර පවතින අත්තිකාරම් කමිටුවක් පත්කර නිරවුල් කිරිමට පියවර ගෙන ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව අත්තිකාරම් අයකර ගැනිමට ක්‍රියාමාර්ග ගත යුතුවේ. |
| (ආ) මුදල් රෙගුලාසි 571 | දීර්ඝ කාලයක සිට තැන්පත් ගිණුමේ අඛණ්ඩව ශේෂයක් ලෙස දක්වා ඇති රු.15,160,840ක තැන්පතු නියාදනය කර නොතිබුණි. | ඇතැම් දීර්ඝකාලයක සිට පවතින තැන්පතු ආදායමට මාරුකිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව තැන්පතු ගෙවා නිරවුල් කිරීමට හෝ ආදායමට මාරුකිරීමට කටයුතු කළ යුතුවේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.9,523,357 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 18,709,100 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ සියළුම ආදායම් රැස්කිරීම්වල කාර්යසාධනය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ හිඟ වරිපනම් හා බදු එකතුව රු.10,166,724ක් අයකර | රටෙහි පැවැති කොවිඩ් - 19 කොරෝනා වසංගත තත්ත්වය | හිඟ මුදල් අයකිරීමට ක්‍රියාමාර්ග ගත |

| | | |
|---|---|---|
| ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | හේතුවෙන් සියළුම කටයුතු ඇනහිට තිබුණි. වර්තමානයේ දේපළ තක්සේරු කිරීමට කටයුතු කරමින් පවති. | යුතුවේ. |
| **(ආ)** පළාත් සභාවේ ප්‍රධාන ලේකම් වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2021 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ මුදල් රු.2,754,844 ක් සහ මුද්දර ගාස්තු රු.10,408,908ක් ලැබිය යුතුව තිබුණි. | ඉදිරියේදී ලබාගැනීමට කටයුතු කරනු ලැබේ. | උසාවි දඩ සහ මුද්දර ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 හඳුනාගත් පාඩු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 ජූනි 07 දින කවසිමා යන්ත්‍රය හා සම්බන්ධිත රු.27,774,030ක් වටිනා අමතර කොටස් ගින්නෙන් හානියට පත්වී තිබූ අතර, අදාල හානියෙන් වූ පාඩුවට වගකිව යුතු පාර්ශවයන් 2022 ජූනි 30 දින වන විටත් සභාව විසින් හඳුනාගෙන නොතිබුණි. | ඔබ විසින් සඳහන් කරුණු අවධානයට යොමුකර කටයුතු කරනු ලැබේ. | හානි සඳහා වගකිව යුතු පාර්ශව හඳුනාගෙන අලාභය අයකර ගැනිමට පියවර ගත යුතුවේ. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 1995 සිට 2013 වර්ෂය දක්වා පළාත්පාලන ආයතනවල විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු රු. 2,375,058ක මාසික දායක මුදල් 2022 මාර්තු 31 දින වන විටත් නිරවුල් කර නොතිබුණි. | මෙම මුදල් යැවීමට සභාවේ මූල්‍ය තත්ත්වය සහ ද්‍රවශීලතාව සැලකිල්ලට ගෙන පියවර ගනු ලැබේ. | දායක මුදල් විශ්‍රාම වැටුප් සැලැස්මට ගෙවීමට ක්‍රියාමාර්ග ගත යුතු වේ. |
| (ආ) මූල්‍ය ප්‍රකාශනවල බැරකමක් ලෙස දක්වා තිබූ රු.6,643,239ක වියදම් ණයහිමියෝ වර්ෂ 05කට අධික කාලයක් නිරවුල් කර නොතිබුණි. | කිසිදු ලියකියවිලි හෝ ලේඛනයක් ලබාගත නොහැකි හෙයින් පළාත් පාලන කොමසාරිස් සහ නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවරයාගේ අවධානයට යොමුකර ක්‍රියාමාර්ග ගනු ලැබේ. | ණය නිරවුල් කිරීමට පියවර ගත යුතුය. |
| (ඇ) කෞතුකාගාරයේ ඇති කෞතුක භාණ්ඩ පිළිබඳව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් 2022 ජූනි 30 දින වන විටත් සිදුකර නොතිබුණි. | කෞතුකාගාරය පිළිබඳව ඔබ විසින් සඳහන් කළ කරුණු අවධානයට යොමුකර කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව, වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකළ යුතුය. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කළ සේවක සංඛ්‍යාවට අනුව සභාව විසින් තනතුරු 17කට අයත් තනතුරු පුරප්පාඩු 39ක් පුරවා නොතිබුණි. | තනතුරු අනුමත කිරීම සහ තනතුරු පුරප්පාඩු පිරවීමට ආකෘතිපත්‍ර සකස් කර අප විසින් යවා ඇත. | තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | විශ්‍රාම ගිය, සේවය අත්හැර ගිය, මිය ගිය සේවකයින් 08ගෙන් අයකළ යුතු රු.440,550ක ණය මුදල විශ්‍රාම පාරිතෝෂිකයෙන් හෝ ඇපකරුවන්ගෙන් අයකිරිමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පියවර ගෙන නොතිබුණි. | මෙම ණය නිරවුල් නොකිරිම හේතුවෙන් මෙම පුද්ගලයින්ට එරෙහිව නඩු පැවැරීමට ක්‍රියාමාර්ග ගෙන තිබුණි. | සේවක ණය ඔවුන්ගෙන් හෝ ඇපකරුවන්ගෙන් අයකිරිමට පියවර ගත යුතුය. |

## 4. ශිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 4.1 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2017 අංක 19 දරන තිරසාර සංවර්ධන පනත ප්‍රකාරව තිරසාර සංවර්ධන අරමුණු හඳුනාගෙන නොතිබුණි. | 2020 වර්ෂයේ තිරසාර සංවර්ධන ඉලක්කයන් ස්ථාපිත කර ඒවා ළඟාකර ගැනිම සඳහා විවිධ ක්‍රියාමාර්ග ගෙන ඇති අතර ඉලක්ක ළඟාකර ගැනිම් තක්සේරු කිරීමටත් ක්‍රියාමාර්ග ගනු ලැබේ. | තිරසාර සංවර්ධන අරමුණු හඳුනාගෙන ඒවා ක්‍රියාත්මක කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු වේ. |